
# සතුටින් තෝරමු




තිනුලි වික්‍රමරත්න

# සතුටින් තෝරමු

තිනුලි වික්‍රමරත්න

# සතුටින් තෝරමු

*කතෘ ප්‍රකාශනයකි.*

*ප්‍රථම මුද්‍රණය 2023 නොවැම්බර්*

*කතෘගේ වෙනත් කෘති*

- *අමාලියාගේ උපන්දිනය*
- *සිඟිති වැඩ පොත*
- *යාළුවුන පීරාෆ්*
- වලස් පැංචාට පාඩමක්
- පුංචි මගේ සිතුවිලි
- සුපුනිට තෑග්ගක්
- හඳ ඇල්ලූ හැටි
- ආඩම්බර සමනලයා

ISBN – 978624206904-3

# පිදුම

මට ජීවිතය දුන් මගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්,
කුඩා කලම මා පුංචි කතුවරියක් කළ
මගේ දෙවැනි අම්මා වූ රංජනී සෙන්දනායක
ආදරණීය ගුරු මෑණියන්ටත්,
දැනට මා ඉගෙනුම ලබන **5**-A පන්තියේ
අමිතා කුමාරිහාමි ආදරණීය ගුරු මෑණියන්ටත්,
"ඔයාට පොත් ගොඩක් ලියන්න පුළුවන් තිනුලි"
කියමින් මා දිරිමත් කළ
ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ටත්,
පරිගණක කරනයෙන් අකුරු සකසා මෙම පොත
නිම කිරීමට මා හට සහයෝගය දුන්
මගේම ආදරණීය අක්කාටත්
මෙම පොත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාවන්ත දැනුමින් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව යි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සහිත ලේඛන අංකුර දහස් ගණනනක් වැපිරීමට  ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි. **2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කර දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමව්පියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමන ලදී.


ශෂිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහමායා බාලිකා විද්‍යාලය<br>
මහනුවර


**2023.11.01**

# පුංචි යාලුවනේ මේ තේරවිලි කියන්නේ.....

- අර්ථය සඟවා ප්‍රහෙලිකාවක ආකාරයෙන් යමක් ඉදිරිපත් කිරීම තේරවිල්ලක් යයි කිවහොත් නිවැරදිය.
- බාල තරුණ මහලු කා හට වුවත් කිසිදු භේදයකින් තොරව විනෝදය හා දැනුම ලබාදෙන තේරවිලි වලට ඇත්තේ ඉතා දිගු ඉතිහාසයකි.

තේරවිලි වර්ග 3කි එනම්,

- තුන් තේරවිලි
- තේරවිලි කවි
- පද පෙරලි

යනුවෙනි.

# 1. තුන් තේරවිලි

- ගොහුරු වේල්ල - ගොහුරු නම් මඩ
  වේල්ල නම් කණ්ඩිය
  මඩකණ්ඩිය - කඩමණ්ඩිය.



- වන්දි මුදල - වන්දි නම් දඩ
  මුදල නම් කාසි
  දඩ කාසි - කඩදාසි.



- බුදු කුස්සිය - බුදු නම් මුනි

  කුස්සියෙ නම් පැල

  මුනි පැල - පැණි මුල




- ටිකක් කැළය - ටිකක් නම් මද

  කැළය නම් වල

  මද වල - වද මල



- තියුණු යහන - තියුණු නම් උල්
  යහන නම් සයන
  උල් සයන - සල් උයන



- ගජ නාලය - ගජ නම් ඇත්
  නාලය නම් බටය
  ඇත් බටය - බත් ඇටය




# 2. තේරවිලි කවි

- දියපිට මස් - මස් පිට කටු
කටු පිට ලොම් - ලොම් පිට හම්
හම් පිට අං



- සත් සමුදුරේ දිය පල්ලේ උපන්නේ
එම සමුදුරේ දිය මතුපිට පිපෙන්නේ
වැස්සට පිනි බබා නිතරම මෝරන්නේ
අද බැරිනම් හෙට තෝරා එවන්නේ

- සත් සමුදුරේ දිය පල්ලේ තිබෙයි අල
එම සමුදුරේ දිය මතුපිට තිබෙයි කොළ
වැස්සට පිනි බබා මෝරන කැකුළු මල
මස්තකයින්ට මුතු කුඩයකි නෙළුම් මල



- බෙල්ලක් සැබැයි ඔලුවක් නැති උන්දෑ ය
අතුත් හැබැයි ඇඟිලිත් නැති උන්දෑය
බඩත් හැබැයි බඩවැල් නැති උන්දෑය
එහෙම කෙනෙක් මහා සබයක උන්දෑය



- මොනරෙක් ඉදී දස අත පිල් විදාගෙන
කෙනෙක් සිටිති කද මැද්දෙන් බදාගෙන
ගෙඩි කති ලෙලිනොකති හැමදෙන බෙදාගෙන
මෙතුන් පදය තෝරා පවසන් නැණින



- නැකත් බලන්නට යන්නෙකි - ඉලව් මගුල් හඳුනන්නෙකි

වැඩිහිටියන් පිළිගන්නෙකි - මෙන්න මෙයත් තෝරන් සකි



- ටිං ටිං ගාන්නා තෝරා එවාපන්

ටං ටං ගාන්නා තෝරා එවාපන්
මගවැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

- ටිං ටිං ගාන්නා ලේනා නොවේදෝ

ටං ටං ගාන්නා ගෝනා නොවේදෝ
මගවැලි පිසින්නා කුකුළා නොවේදෝ
දෙගම්බඩ රජා කිඹුලා නොවේදෝ





# 3. පද පෙරළි

- එවරනුළිය - නුවරඑළිය
- වඩකත - කඩවත
- මාරම්නල - නාරම්මල
- කොංදටුව -දංකොටුව
- වල් පොත්ත- පොල් වත්ත
- මුකබානා -බකමූණා
- මාස රොල -රෝස මල
- නමසලයා -සමනලයා
- කිල්පොච්චා -පොල්කිච්චා
- ඇස් කොට -කොස් ඇට
- බැල් පෝය -පොල් බැය
- දෙමි කිනවා -කිමි දෙනවා
- වත්තල පිංගෙඩිය -පිත්තල වංගෙඩිය
- කල් පොට්ට -පොල් කට්ට
- ගුන්නැරම -නැන්ගුරම

# නිමි!



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවත් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතික නව මාවතකට යොමු කරමින් පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මේ විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනනගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 .11. 01